# 2012



## මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ සමාලෝචනය.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 1928 මාර්තු මස පළමු වන දින පිහිටුවන ලද අතර මෙය දෙපාර්තමේන්තුවේ 84 වන කාර්යසාධන වාර්තාවයි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය හා වේරහැර උප කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල හරහාද ක්‍රියාත්මක කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් ලෙස මෝටර් වාහන නව ලියාපදිංචි කිරීම, හිමිකම් මාරු කිරීම ලියාපදිංචි සහ රියදුරු බලපත්‍ර නිකුත් කිරීම දැක්විය හැක. එමෙන්ම මෙහි අතුරු කාර්යයන් වශයෙන් මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව, මාර්ග ආරක්‍ෂාව පිළිබඳ කටයුතු හා වායු විමෝචන තත්ත්ව නියාමනය කිරීම ආදිය දැක්විය හැක.

වසර 2012 දී අළුතින් ලියාපදිංචි වූ මෝටර් වාහන ප්‍රමාණය 397,295 ක් වූ අතර, එම වසර අවසන් වන විට එහි ප්‍රතිඵලයක් ලෙසින් ශ්‍රී ලංකාවේ සමස්ථ මෝටර් රථ ගහනය 4,877,027 විය. මෙම වසරේ දී සිදු කරන ලද මෝටර් වාහන පැවරුම් සංඛ්‍යාව 274,800 ක් වන අතර නිකුත් කරන ලද රියදුරු බලපත් ප්‍රමාණය 618,053 වේ.වායු විමෝචන කාර්යයන් යටතේ ජංගම වායු විමෝචන පරීක්ෂණ ඒකකයක් ඇති කරන ලද අතර උතුරු පළාත තුළද මධ්‍යස්ථාන 26 ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබයි.

විශිෂ්ට මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය යන දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඉටුකරන සේවාවන් කඩිනමින් හා ඉහළ මහජන ප්‍රසාදයකින් යුක්තව ඉටු කිරීම සඳහා ආයතනයේ සියළු කාර්ය මණ්ඩලය කැපවී සේවය කල අතර ඔවුන්ටත් දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා මහ පෙන්වීම ලබා දුන් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියළුම අමාත්‍යාංශ කාර්යමණ්ඩලයටත් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම තුලින් අප කාර්යක්ෂමව මෙහෙයවූ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

**එස්.එච්.හරිස්චන්ද්‍ර**

# පටුන


පිටු අංකය

අපේ දැක්ම ........……………..…………………………………… vii

අපේ මෙහෙවර …………...…………...……………………… vii

අපේ වටිනාකම් …………. ..………………………………… vii

1. කාර්ය මණ්ඩලය …………………….. 1

1.1 මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය - 2012 ...…………………… 1

1.2 අනුමත සේවක සංඛ්‍යාව - 2012 …………………….. 2

1.3 2012 වර්ෂයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවීම ලබා පැමිණි මාණ්ඩලික නිලධාරීන් …………………….. 3

1.4 2012 වර්ෂයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය මාණ්ඩලික නිලධාරීන් …………………….. 3

2. කාර්ය මණ්ඩල අභිප්‍රේරණ …………………….. 4

2.1 අභ්‍යන්තර පුහුණු …………………….. 4

2.2 බාහිර පුහුණු …………………….. 4

3. පරිපාලනමය කටයුතු …………………….. 5

3.1 ප්‍රධාන කාර්යාලයේ අංශ …………………….. 7

3.2 කොමසාරිස් ජනරාල් කාර්යාලය …………………….. 8

3.3 ආයතන අංශය …………………….. 8

3.4 සංවර්ධන අංශය …………………….. 9

3.5 උප කාර්යාලය …………………… 9

3.6 දිස්ත්‍රික් කාර්යාලය …………………… 10

3.7 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක …………………… 11

4. දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් …………………… 11

4.1 වාහන අයිතිය අළුතින් ලියාපදිංචි කිරීම …………………… 11

4.1.1 වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව 1 ...………………… 15

4.1.2 වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව 11 ...………………… 16

4.1.3 ත්‍රිරෝද රථ නව ලියාපදිංචි ශාඛාව …………………... 16

4.1.4 යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව …………………… 18
4.2 වාහන හිමිකම් මාරු කිරීම ………………….. 19
4.2.1 පැවරුම් අංශ වල කාර්යභාර්ය ………………….. 20
4.2.2 පැවරුම් අංශ වල නිලධාරී සංයුතිය ………………….. 20
4.2.3 පැවරුම් අංශ වල කාර්යයන්ගේ ප්‍රගතිය ………………….. 21
4.3 වේරහැර උප කාර්යාලය (රියදුරු බලපත්‍ර නිකුත් කිරීම ) ………………… 23
4.3.1 කාර්ය මණ්ඩලය ………………… 24
4.3.2 රියදුරු බලපත්‍ර නිකුත් කිරීම ………………… 24
4.4 කාර්මික සේවාව ………………… 26
4.5 වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් නියාමනය කිරීම ………………… 27

5. ආදායම සහ වියදම
5.1 ගිණුම් ශාඛාව …………………… 29
5.2 සුබෝපබෝගී බදු ශාඛාව …………………… 30
5.3 අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව …………………… 30
5.4 ආදායම් ගිණුම …………………… 31
5.5 වියදම් ගිණුම …………………… 31
5.5.1 මූල්‍ය ප්‍රගතිය …………………… 32
5.6 ඉදිකිරීම් සම්බන්ධ ප්‍රාග්ධන වැය ව්‍යාපෘති …………………… 33

ඇමුණුම් 1 වාහන අළුතින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2012 …………………… 34
ඇමුණුම් 2 වාහන පැවරීමේ ගාස්තු - 2012 (එක්දින සේවා) …………………… 36
ඇමුණුම් 3 වාහන පැවරීමේ ගාස්තු - 2012 (සාමාන්‍ය ගාස්තු) ..………………….. 37
ඇමුණුම් 4 නව රියදුරු බලපත්‍රයන්ට අදාළ අධිහාරයන් ………………….. 38

# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

අංක *341*, ඇල්විටිගල මාවත, කොළඹ 05.

දුරකථන අංක *: 2634331 – 6* ෆැක්ස් අංක *2694338*

විද්‍යුත් තැපැල : *comm..@motortraffic.gov.lk*

වෙබ් අඩවිය *www.motortraffic.gov.lk*

ආරම්භය - 1928 ජනවාරි 01


## අපේ දැක්ම

*“ විශිෂ්ඨ මෝටර් වාහන නියාමනයෙන් ඉහල මහජන ප්‍රසාදය ”*

## අපේ මෙහෙවර

*“අභිප්‍රේරණය වු සේවක සමූහයේ සාමූහික ප්‍රයත්නය හා නවීන තාක්‍ෂණය යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ප්‍රශස්ථ ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ඉහළ මහජන ප්‍රසාදයක් උදෙසා කැපවීම.”*

## අපේ වටිනාකම



# 1. කාර්යමණ්ඩලය

## 1.1 මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය - 2012

- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් - එච්.එස් හරිස්චන්ද්‍ර මහතා
- කොමසාරිස් (පාලන) - පී.පී.කේ. අබේසිරිගුණවර්ධන මිය
- කොමසාරිස් (සංවර්ධන) - යූ.කේ. බණ්ඩාර මහතා
- නියෝජ්‍ය කොමසාරිස් (සංවර්ධන) - පී.එච්.සී. රත්නායක මහතා
- සහකාර කොමසාරිස් (වෙලඳ වා. පැ. ශාඛාව) - කේ.ටී.එම්.එස්. සේරසිංහ මහතා
- සහකාර කොමසාරිස් (වේරහැර) - ජී.එච්.ආර්. ගුණවර්ධන මහතා
- සහකාර කොමසාරිස් (තොරතුරු තාක්‍ෂණ) - මධුක බණ්ඩාර මහතා
- සහකාර කොමසාරිස් (කාර් පැවරුම් ශාඛාව) - බී.ජ්. ප්‍රේමසිංහ මහතා
- සහකාර කොමසාරිස් (ත්‍රීවිල් න.ලි.ප) - කේ.එච්.ජේ.එල්.සේනාරත්න මිය
- සහකාර කොමසාරිස් (ත්‍රීවිල් පැවරුම් ශාඛාව) - කේ.එස්.විජයකීර්ති මහතා
- සහකාර කොමසාරිස් (යතුරුපැදි පැවරුම් ශාඛාව) - ආර්.ජ්.කේ. රේණුකා මිය
- සහකාර කොමසාරිස් (සංවර්ධන) - සී.ඩබ්.කේ. ධර්මසේන මහතා
- සහකාර කොමසාරිස් (වෙලද වාහන න.ලි.ප) - එන්.ආර්.කැකුලන්දල මහතා
- සහකාර කොමසාරිස් (බස්,ඉඩම් වාහන පැවරුම් ශාඛාව) - ටී.එන්. ද සිල්වා මිය
- සහකාර කොමසාරිස් (වේරහැර) -කේ.ඩී.සී.එස් කුමාරතුංග මහතා
- සහකාර කොමසාරිස් (වේරහැර) - එන්.පී අමරතුංග මහතා
- ප්‍රධාන ගණකාධිකාරී - ඩී.එස්.ආර්.කේ.ගුණතිලක මිය
- ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආර්.කහඳුවආරච්චි මහතා
- ගණකාධිකාරී (ගෙවීම්) -ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මහතා
- ගණකාධිකාරී (ආදායම්) - අයි.ජී.එස්.එස්.සිරිමාන්න මිය
- වැ:බ සහකාර කොමසාරිස් (කාර්මික) - එස්.ජ්. ප්‍රේමරත්න මහතා
- පරිපාලන නිලධාරී (පාලන) - ඩී.එම්. ගුණතිලක මහතා
- පරිපාලන නිලධාරී (සංවර්ධන) - ඩී.ඩබ්.එස්. එන්. සිල්වා මිය
- සහකාර දත්ත සැලසුම් කළමණාකරු - පී.ඩබ්.පී.බී. ඊරියගම මහතා
- වැඩසටහන් සම්පාදක - කේ.කේ.ආර්. සමරවීර මහතා

## 1.2 කාර්යමණ්ඩල තොරතුරු හා අනුමත සේවක සංඛ්‍යාව - 2012

### 1.2.1 වගුව

| තනතුරු නාමය | අයත් සේවය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | අනුමත | සිටින | පුරප්පාඩු |
| කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| අතිරේක කොමසාරිස් (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| අතිරේක කොමසාරිස් (සංවර්ධන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| නියෝජ්‍ය /සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 15 | 14 | 01 |
| නියෝජ්‍ය කොමසාරිස් (කාර්මික) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| සහකාර / සහකාර කොමසාරිස් (කාර්මික) | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 01 | 00 | 01 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | | 01 | 00 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | | 01 | 01 | 00 |
| ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 02 | 02 | 00 |
| නීති නිලධාරී | | 01 | 00 | 01 |
| පරිපාලන නිලධාරී | රාජ්‍ය කලමනාකරණ සේවය | 03 | 02 | 01 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තන සේවය | 02 | 00 | 02 |
| පරිගණක වැඩසටහන් සම්පාදක | දෙපාර්තමේන්තු සේවය | 02 | 01 | 01 |
| ප්‍රධන මෝටර් වාහන පරීක්ෂක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 16 | 04 | 12 |
| කලමනාකරණ සහකාර | රාජ්‍ය කලමනාකරණ සේවය | 251 | 247 | 04 |
| මෝටර් වාහන පරීක්ෂක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 114 | 110 | 04 |
| නීති සහකාර | ආශ්‍රිත නිලධාරී සේවය | 03 | 01 | 02 |
| විමර්ශන හා සංවර්ධන සහකාර | ආශ්‍රිත නිලධාරී සේවය | 123 | 124 | -1 |
| සංවර්ධන සහකාර | ආශ්‍රිත නිලධාරී සේවය | 200 | 189 | 11 |
| වැඩසටහන් දත්ත පාලක | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| පරිගණක පද්ධති ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | 02 | 02 | 00 |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු | දෙපාර්තමේන්තු සේවය | 09 | 09 | 00 |
| කාර්මික සහකාර | රාජ්‍ය කලමනාකරණ සේවය | 01 | 00 | 01 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | දෙපාර්තමේන්තු සේවය | 83 | 82 | 01 |
| පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| රියදුරු | රියදුරු දෙපාර්තමේන්තු | 11 | 09 | 02 |
| කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සෙවය | 82 | 71 | 11 |
| දෙපාර්තමේන්තු කම්කරු | දෙපාර්තමේන්තු සේවය | 28 | 27 | 01 |
| සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තු සේවය | 06 | 06 | 04 |
| මුළු එකතුව | | **964** | **909** | **60** |

**1.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි මාණ්ඩලික නිලධාරීන් - 2012**

| | | | |
|---|---|---|---|
| 1 | එස්.එච්.හරිස්චන්ද්‍ර මහතා | - මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් | - 2012.03.23 |
| 2 | පී.පී.කේ අබේසිරි ගුණවර්ධන මහත්මිය | - කොමසාරිස් (පාලන) | - 2012.01.02 |
| 3 | කේ.ඩී.එස්.සී කුමාරතුංග මහතා | - සහකාර කොමසාරිස් | - 2012.01.02 |
| 4 | කේ.ඩී.බී ජයසිංහ මහතා | - සහකාර කොමසාරිස් | - 2012.01.02 |
| 5 | ඒ.එල්.කේ.එම්.එම්.පී බණ්ඩාර මහතා | -සහකාර කොමසාරිස් | - 2012.01.02 |
| 6 | එන්.පී අමරතුංග මහතා | - සහකාර කොමසාරිස් | - 2012.01.03 |
| 7 | කේ.වී.එස් බන්දුකීර්ති මහතා | - නියෝජ්‍ය කොමසාරිස් | - 2012.10.22 |
| 8 | ටී.එන් චන්ද්‍රසිරි මහතා | - පරිපාලන නිලධාරි (සංවර්ධන) | - 2012.10.10 |

**1.4 ස්ථාන මාරුවීම් ලබා ගොස් ඇති මාණ්ඩලික නිලධාරීන් - 2012**

| | | | |
|---|---|---|---|
| 1 | බී.ඩී.එල් ධර්මප්‍රිය මහතා | - මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් | - 2012.03.01 සිට 2014.03.01 දක්වා විදේශ නිවාඩු |
| 2. | ජී.එස්.කේ කන්නන්ගර මහතා | - අතිරේක කොමසාරිස් | - 2012.01.02 |
| 3. | යූ.කේ බණ්ඩාරමහතා | - කොමසාරිස් (සංවර්ධන) | - 2012.12.21 |
| 4. | පී.එච්.සී රත්නායක මහතා | - නියෝජ්‍ය කොමසාරිස් | - 2012.05.05 |
| 5. | ජී.එච්.ආර් ගුණවර්ධන මහතා | - සහකාර කොමසාරිස් | - 2012.12.31 |
| 6. | ඩී.එම් ගුණතිලක මහතා | - පරිපාලන නිලධාරි (පාලන) | - 2012.05.04 |
| 7. | ඩී.එස්.ආර්.කේ ගුණතිලක මිය | - ප්‍රධාන ගණකාධිකාරි | - 2012.12.05 සිට විශ්‍රාම |

## 02. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය

### 2.1 අභ්‍යන්තර පුහුණු

| දිනය | වැඩමුළුව | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2012.04.05-2012.04.06 | 2012 උපාධිධාරී පත්වීම් යටතේ නවක පත්වීම් ලබා පැමිණි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 52 |
| 2012.06.26 | ඉහළ මහජන ප්‍රසාදයකින් යුතුව මහජන සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා වූ පුහුණු වැඩසටහන් | 32 |
| 2012.10.22 | ISO 9001:2008 තත්ව කලමනාකරණ පද්ධතිය සඳහා වූ පුහුණු වැඩසටහන | 30 |
| | 2012 උපාධිධාරී පත්වීම් යටතේ නවක පත්වීම් ලබාපැමිණි නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීම සඳහා වූ පුහුණු | 189 |


### 2.2 බාහිර පුහුණු

| කාල සීමාව | ආයතනය | පාඨමාලාව | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|
| 2012.05.07 | මිලෝදා ආයතනය | Government payroll management system | 02 |
| 2011.05.10 | Skill Development Fund Ltd. | Developing secretaries & Receptionists | 01 |
| 2012.05.16-2012.05.18 | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය | Super 5s & Kizen Management | 03 |
| 2012.08.20 | දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය-බදුල්ල | Computer Driving Licence | 02 |

| | | | |
|---|---|---|---|
| *2012.10.23-2012.10.24* | *ශ්‍රී ලංකා පදනම් ආයතනය* | *workshop on good governance & Leadership* | *03* |
| *2012.10.08 – 2011.10.24* | *SLIDA* | | *02* |
| *2012.12.06 – 2011.12.14* | *ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය* | *ශ්‍රම ඵලදායීතා වර්ධනය සඳහා කාර්යාල කළමනාකරණය* | *03* |

## 03. පරිපාලනමය කටයුතු

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමා කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය මූලික කර ගනිමින් සිදු වන අතර වේරහැර උප කාර්යාලය හා දීප ව්‍යාප්තව ස්ථාන ගත කර ඇති දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල ඒ මඟින් මෙහෙයවනු ලබයි. මෙහි පරිපාලන කටයුතු ප්‍රධාන වශයෙන් කොමසාරිස් ජනරාල් කාර්යාලය, ආයතන අංශය හා සංවර්ධන අංශය යන අංශ තුන මගින් සිදු කෙරේ. දෙපාර්තමේන්තුවේ පරිපාලන ධුරාවලිය පහත සංවිධාන සටහන මගින් දැක්විය හැක.


DEPARTMENT OF MOTOR TRAFFIC
ORGANIZATIONAL STRUCTURE
DMT
COMMISSIONER GENERAL OF MOTOR TRAFFIC
G.A/D.S
COMMISSIONER (ADMINISTRATION)
COMMISSIONER (DEVELOPMENT)
CHIEF ACCOUNTANT
P.D.(E)
D.C (DL)
D.C (Tr)
D.C (NR)
Acct (IA)
A.C.AD
A.C (DL)
A.C (Tr)
A.C (NR)
AC (IT)
Acct (P)
Acct (R)
ACC (DL)
Ac (T)
Ac
C.O
L.O
A.L.O
A.O.RR
A.O.AD
A.O.
ADPM
A.O.DE
TA
SEMV
S.O(RR1)
S.O(RR2)
S.O(Ad)
S.O
PRGM
T.O
S.K
S.O(T)
EMV
S.O(NP)
EMVV
T.O.(E)
Staff
DESIGNATION ABBR.
G.A/D.S: GOVERNMENT AGENT / DISTRICT SECRETARY/DIVISIONAL SECRETARY
Acct: ACCOUNTANT
L.O: LEGAL OFFICER
A.L.O: ASSISTANT LEGAL OFFICER
A.O.AD :ADMINISTRATIVE OFFICER
SEMV : SENIOR EMV
STO : STATISTICAL OFFICER
TA: TECHNICAL ASSISTANT
STAFF: INVESTIGATION AND DEVELOPMENT ASSISTANTS + MANAGEMENT ASSISTANTS + DRIVERS+ KKS
SUBJECT ABBR.;
D.L: DRIVING LICENSE
T: TECHNICAL
Tr. : TRANSFER
NP : NUMBER PLATES
E : EMMISON
NR : NEW REGISTRATION
RR1 : RECORD ROOM 1
P.D : PROJECT DIRECTOR (EMISION)
D.C : DEPUTY COMMISSIONER
A.D.P.M : ASSISTANT DATA PROCESSING MANAGER
S.O : SUPERVISING OFFICER
EMV : EXAMINER OF MOTOR VEHICLES
A.L.O : ASSISTANTS LEGAL OFFICER
IT : INFORMATION TECHNOLOGY
RR2 : RECORD ROOM 2
A.O.RR : ADMINISTRATIVE OFFICER RECORD ROOM
A.C : ASSISTANT COMMISSIONER
PRGM : PROGRAMMER
S.K : STORES KEEPER
STN : STATISTICIAN
A.O.DE : ADMINISTRATIVE OFFICER DEVELOPMENT
T.O : TECHNICAL OFFICER
T.O(E ): TECHNICAL OFFICER E
C.O : CORDINATING OFFICER

**3.1 ප්‍රධාන කාර්යාලයේ අංශ**

1. කොමසාරිස් ජනරාල් කාර්යාලය
2. ආයතන ශාඛාව
3. සංවර්ධන ශාඛාව
4. ගිණුම් ශාඛාව
5. පරිගණක හා තොරතුරු තාක්‍ෂණ ශාඛාව
6. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව
7. නීති ශාඛාව
8. සුබෝප‍භෝගී බදු ශාඛාව
9. ප්‍රධාන ලිපිකරු ශාඛාව
10. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාවI
11. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II
12. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
13. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව
14. මෝටර් කාර් පැවරුම් ශාඛාව
15. වෙළඳ වාහන පැවරුම් ශාඛාව
16. ලොරි පැවරුම් ශාඛාව
17. බස් හා ඉඩම් වාහන පැවරුම් ශාඛාව
18. ත්‍රීරෝද රථ පැවරුම් ශාඛාව
19. යතුරුපැදි පැවරුම් ශාඛාව
20. කාර්මික ශාඛාව
21. අංක තහඩු (කොළඹ) ශාඛාව
22. අංක තහඩු (පිටපළාත්) ශාඛාව
23. ලේඛණාගාර 1
24. ලේඛණාගාර 11
25. සංඛ්‍යාලේඛන ශාඛාව

### 3.2 කොමසාරිස් ජනරාල් කාර්යාලය

| | |
|---|---|
| කොමසාරිස් ජනරාල් | : එච්.එස් හරිස්චන්ද්‍ර මහතා (ශ්‍රී.ලං.ප.සේ. I) |
| පෞද්ගලික සහකාර | : එච්.එස්. අබේතුංග මිය |
| කාර්ය මණ්ඩලය | : 03 |

**<u>අංශයේ කාර්යභාරය</u>**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ කාර්යභාරයන් සඳහා සහාය වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

### 3.3 ආයතන අංශය

| | |
|---|---|
| කොමසාරිස් ( පාලන) | : පී.පී.කේ අබේසිරි ගුණවර්ධන මහත්මිය |
| සහකාර කොමසාරිස් | : කේ.ටී.එම්.එස්.සේරසිංහ මහතා |
| පරිපාලන නිලධාරී | : ඩී.එම්. ගුණතිලක මහතා |
| අධීක්ෂණ නිලධාරී | : බී.ආර්.කේ පෙරේරා මහතා |
| | |
| කාර්ය මණ්ඩලය | : 36 |

**<u>අංශයේ දැක්ම</u>**

*"සුභවාදී සිතුවිලි තුළින් ඵලදායී රාජ්‍ය සේවයක්"*

**<u>අංශයේ කාර්යභාරය</u>**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ ආයතන හා පරිපාලන කටයුතු ඉටු කිරීම සහ අනෙකුත් යටිතල පහසුකම් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන අතර ඒ අනුව කාර්ය මණ්ඩලය පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම, සේවා දීර්ඝ ලබා දීම හා විනය කටයුතු ද පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම ද , ඊට අමතරව වැටුප් වර්ධක අනුමත කිරීම, විවිධ ණය වර්ග අනුමත කිරීම, අග්‍රහාර රක්ෂණ බිල්පත් නිරවුල් කිරීම, පරිපාලනමය කටයුතු වශයෙන් ද ඊට මතරව ජලය, දුරකථන, විදුලි බිල්පත් පියවීම ද මෙම අංශය තුළින් සිදුකරනු ලබන මූලික කාර්යයන් වේ.

### 3.4 සංවර්ධන අංශය

කොමසාරිස් (සංවර්ධන) : යූ.කේ. බණ්ඩාර මහතා (ශ්‍රී.ලං.ප.සේ. I)

පරිපාලන නිලධාරී : ඩී.ඩබ්.එස්.එන්. ද සිල්වා මහත්මිය

අධීක්ෂණ නිලධාරී : ආර්. ඊෂ්වරලිංගම් මහතා.

කාර්ය මණ්ඩලය : 05

<u>**අංශයේ දැක්ම**</u>

තෘප්තිමත් සේවක සමූහය තුළින්,ඉහල මහජන ප්‍රසාදයක්

<u>**අංශයේ කාර්යභාරය**</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවමින් ඉදිකිරීම් කටයුතු පවත්වාගෙන යාම, සේවක අභිප්‍රේරණය සඳහා අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,දෙපාර්තමේන්තුවේ සියළු අංශවල සහ ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගති වාර්තා රැස් කිරීම හා ප්‍රගති සමාලෝචනය, අමාත්‍යාංශ හා වෙනත් අංශවලට යොමු කල යුතු සියළුම ප්‍රගති වාර්තා, අයවැය වාර්තා,කාර්ය සාධන වාර්තා, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු වැනි දෙපාර්තමේන්තුවේ වැදගත් කාර්යයන් රැසක් මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

### 3.5 උප කාර්යාලය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ක්‍රියාත්මක වන වේරහැර උප කාර්යාලය තුළින් ප්‍රධාන කාර්යාලයේ සේවාවන්ගෙන් බැහැරව සිදුවන අනෙකුත් දෙපාර්තමේන්තුමය කාර්යයන් වන රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාල සියළු කාර්යයන් හා වාහන පරීක්ෂාව, බර සහතික නිකුත් කිරීම හා එයට අදාල සියළු කටයුතු සිදුකරනු ලබයි.මෙම කාර්යාලයේ සියළු කටයුතු නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් පාලනය වේ.

### 3.6 දිස්ත්‍රික් කාර්යාල

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් පුළුල් කරමින් හා විමධ්‍යගත කරමින් සේවාලාභීන්ට





තම දිස්ත්‍රික්කය තුලදීම සියළුම සේවාවන් ලබා ගැනිමට මේ වන විට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට අනුබද්ධව හෝ වෙනත් නිශ්චිත භූමි භාගයක පිහිටුවා ඇති අතර මෙම කාර්යාල ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරයෙකු මඟින් පාලනය වේ.දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කිරීම යටතේ අනුරාධපුර,කෑගල්ල,මඩකලපුව,කළුතර,පුත්තලම,ගම්පහ,කුරුණෑගල හා නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිලි වල ඉදිකිරීම් කටයුතු නිමා කර ඇත.මෙම දිස්ත්‍රික් කාර්යාල මඟින් මූලික වශයෙන් රියදුරු බලපත්‍ර සඳහා අයදුම්පත් භාර ගැනීම, බලපත්‍ර නිකුත් කිරීමට අදාල ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සිදුකරනු ලබයි. අනුරාධපුරය හා හම්බන්තොට යන දිස්ත්‍රික් කාර්යාල මගින් රියදුරු බලපත් මුද්‍රණය කර නිකුත් කිරීම ද කුරුණෑගල හා ගම්පහ යන දිස්ත්‍රික් කාර්යාල මඟින් Online පහසුකම් යටතේ රියදුරු බලපත් නිකුත් කිරීම සම්බන්ධ කටයුතු ද සිදු කරනු ලබයි.

මෙම කාර්යයන්ට අමතරව වෙන් කරන ලද අංක මත දිස්ත්‍රික්කයට අදාල යතුරුපැදි නව ලියාපදිංචි කිරීම, දිස්ත්‍රික්කය තුල එම යතුරුපැදි පැවරීම ලියා පදිංචි කිරීම, බර සහතික නිකුත් කිරීම හා කාර්මික සේවාවන්ට අදාල කටයුතු ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා පැවරුම් වලට අදාල සියළු කටයුතු වෙනුවෙන් අයදුම්පත් භාර ගැනීම ද සිදුකරනු ලබයි.

### 3.7 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක

තිරසාර ජාතික ප්‍රතිපත්තීන් ගොඩනැගීමේ අරමුණින් මහින්ද චින්තන ඉදිරි දැක්ම පාදක කර ගනිමින් ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අදාල වැඩසටහන් වල ප්‍රගතිය පහත ආකාරයට සාරාංශ ගත කල හැක.

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය.
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.
- අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය.

## 4 දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන්

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යයන් මූලික වශයෙන් කාණ්ඩ පහක් යටතේ වර්ග කළ හැක.

1. ධාවනය කල හැකි වාහන, මෝටර් රථ වාහන පනතේ නීතිරීති ප්‍රකාරව ලියාපදිංචි කිරිම.
2. වාහන අයිතිය පැවරීම ලියාපදිංචිය.
3. නිපුණතා සහතිකය මත රියදුරන් සඳහා රියදුරු බලපත්‍ර නිකුත් කිරිම.
4. කාර්මික සේවාව.
5. වායු විමෝචන පරීක්‍ෂණ කාර්යයන් අධීක්‍ෂණය කිරීම.

### 4.1 වාහන අයිතිය අලුතින් ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකාව තුල පෙර ලියාපදිංචි සිදු කිරීමක් නොකරන ලද එනම් මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද වාහන ප්‍රථමවරට ලියාපදිංචි කිරීම මින් අදහස් වේ. මෙම පලමු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලිපි ලේඛන වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් පසුව එක් දිනකින් ලියාපදිංචි කටයුතු අවසන් කර අදාල ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලබයි.

දෙපාර්තමේන්තුව තුළින් සපයනු ලබන සේවාවන්ට අමතරව අලුතින් වාහන ලියාපදිංචි කරනු ලබන පුද්ගලයන්ගේ පහසුව සඳහා ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවේ හා ජනශක්ති රක්‍ෂණ සමාගමේ සේවය දෙපාර්තමේන්තු භූමිය තුලදීම ලබා ගැනීමට පහසුකම් සපයා ඇති අතර

පලමු ආදයම් බලපත්‍ර ලබා ගැනීමට බස්නාහිර පළාත් මෝටර් රථ කොමසාරිස් කාර්යාලයේ ඒකකයක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පවත්වා ගෙන යනු ලබයි.

2012 වර්ෂය තුල ලියාපදිංචි වු 397,295 ක මෝටර් වාහන ප්‍රමාණය සමඟ ශ්‍රී ලංකාවේ 2012.12.31 දිනට ලියාපදිංචි වී ඇති මුළු මෝටර් වාහන ගහනය 4,877,027 ක් වේ. එම ප්‍රමාණය වසර 2011 ට සාපේක්ෂව 8.87%ක වැඩි වීමකි.2011 වර්ෂයේ මෙම වර්ධන වේගය 2010ට සාපේක්ෂව 13.28% ක් වු අතර වර්ධන වේගයේ පහල යාමක් 2012 වර්ෂය තුල පෙන්නුම් කරයි. රජය විසින් අය කරනු ලැබූ ආනයනික බදු ප්‍රතිශතය ඉහලයාම වාහනලියාපදිංචියේ පහල යාමට හේතු වු ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක.


**4.1.1** වගුව **:-** වාහන ගහනය

| *වර්ෂය* | *නව ලියාපදිංචි වු වාහන සංඛ්‍යාව* | *මුළු වාහන ගහනය* |
|---|---|---|
| *2008* | *265,199* | *3,390,993* |
| *2009* | *204,075* | *3,595,068* |
| *2010* | *359,243* | *3,954,311* |
| *2011* | *525,421* | *4,479,732* |
| *2012* | *397,295* | *4,877,027* |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

පසුගිය වසර පහක කාලය තුළ ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි වු නව මෝටර් වාහන ප්‍රමාණය හා සමස්ථ වාහන ගහනය 4.1.1 වගුව මගින් සංඛ්‍යාත්මකව හා 4.1.1 ප්‍රස්ථාර සටහන මගින් සාරාංශගතව දැක්විය හැකිය.

**4.1.1** රූප සටහන




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ වාහන නව ලියාපදිංචිය සලකා බැලීමේ දී වසර 2009- 2011 යන කාල සීමාව තුල වාහන ලියාපදිංචිය ක්‍රමයෙන් වර්ධනය විය . නමුත් මෙම තත්වය 2012 වසර තුල නැවතත් වෙනස් වෙමින් වර්ධනයේ පසුබෑමක් පෙන්වා දිය හැක.

නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව වාහන කාණ්ඩ අටක් (08)ක් යටතේ වර්ග කරඇත. එනම්, මෝටර් කාර්, ත්‍රීරෝද රථ, මෝටර් සයිකල්, මෝටර් බස්, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, ඉඩම් වාහන (ට්‍රැක්ටර්) සහ ඉඩම් වාහන (ට්‍රේලර්) ලෙස වේ. ඒ ඒ කාණ්ඩය යටතේ 2012 වසරේ ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව හා එය 2011ට සාපේක්ෂව වර්ධනය වීමේ ප්‍රතිශතය පහත 4.1.2 වගුව මඟින් දැක්විය ඇත.


**4.1.2 වගුව :- නව ලියාපදිංචි වාහන කාණ්ඩ**

| *වාහන පන්තිය* | ***2011 දෙසැම්බර් 31*** *දිනට වාහන ප්‍රමාණය* | ***2012 දෙසැම්බර් 31*** *දිනට වාහන ප්‍රමාණය* | *වැඩිවීම ප්‍රතිශතයක් ලෙසට* |
|---|---|---|---|
| *මෝටර් කාර්* | *57,886* | *31,546* | *- 45.50%* |
| *ත්‍රීරෝද රථ* | *138,426* | *98,815* | *- 28.61%* |
| *මෝටර් සයිකල්* | *253,331* | *192,284* | *- 24.09%* |
| *මෝටර් බස්* | *4,248* | *3,095* | *- 27.14%* |
| *ද්විත්ව කාර්යය වාහන* | *33,518* | *37,397* | *11.57%* |
| *මෝටර් ලොරි* | *14,818* | *12,266* | *- 17.22%* |
| *ඉඩම් වාහන(ට්‍රැක්ටර්)* | *20,073* | *18,450* | *- 08.08%* |
| *ඉඩම් වාහන (ට්‍රේලර්)* | *3,121* | *3,442* | *10.28%* |
| ***එකතුව*** | ***525,421*** | ***397,295*** | ***- 24.38%*** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ද්විත්ව කාර්යය වාහන හා ඉඩම් වාහන (ට්‍රේලර්)නව ලියාපදිංචිය 2011 ට සාපේක්ෂව 2012 දී ධනාත්මකව වර්ධන වි ඇත. අනෙකුත් කාණ්ඩ හය සඳහා වූ සාපේක්ෂ වර්ධන වේගය සෘණ අගයක් ගෙන ඇත. ද්විත්ව කාර්යය වාහන ලියා පදිංචිය වසර 2012 දී 11.57% කින් වර්ධනය වී ඇති අතර දෙවන ස්ථානයට 10.28% ඉහල වර්ධන අනුපාතයක් ඉඩම් වාහන (ට්‍රේලර්)නව ලියාපදිංචියයි.සමස්ථ වාහන නව ලියාපදිංචිය සලකා බැලීමේ දී - 24.38% ක් ලෙස සෘණ වර්ධන අනුපාතයක් පෙන්නුම් කරනු ලැබේ.

**4.1.2** රූප සටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

අලුතින් ලියාපදිංචි වන මෙම වාහන භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගය අනුව ප්‍රධාන වශයෙන් කාණ්ඩ 03 ක් යටතේ වර්ග කල හැක. එනම්,

- පෙට්‍රල් භාවිතා කරන වාහන
- ඩීසල් භාවිතා කරන වාහන
- වෙනත්
  - පෙට්‍රල්/ ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඉන්ධන භාවිතා නොකරන වාහන


**4.1.3** රූප සටහන




2012දී 310,151පෙට්‍රල් භාවිතා කරන වාහන ලෙස ද , 80,779 ඩීසල් භාවිතා කරන වාහන ලෙස ද ලියාපදිංචි වී ඇත. ඊට අමතරව වෙනත් භාවිතයන් අනුව පෙට්‍රල්/ ඉලෙක්ට්‍රිකල් වාහන 2,615ක් ද ඉලෙක්ට්‍රිකල් වාහන 9ක් වැනි සුළු ප්‍රමාණයක් ද ඉන්ධන භාවිතා නොකරන වාහන 3,741 ක් ලෙස ලියාපදිංචි වී ඇත.

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

2012 වසර තුලදී ශ්‍රී ලංකාව තුල අලුතින් ලියාපදිංචි කරන ලද වාහන ආනයනය කරනු ලැබූ රටවල් සලකා බැලීමේ දී 397,295ක් වූ නව ලියාපදිංචි වාහන වලින් 313,215 (79%)ක් ඉන්දියාවෙන් ද39,621 (10%)ක් ජපානයෙන් ද ආනයනය කරන ලද අතර 22,462 (6%)ක් චීනයෙන් ආනයනය කර ඇත. මෙය ප්‍රතිශතාත්මකව විශ්ලේෂණය කිරීමේ දී 2011 දී මෙන්ම 79%ක් වැනි විශාල වාහන ප්‍රමාණයක් ඉන්දියාවෙන් ආනයනය කර ඇති බව පෙනී යයි. එම දත්ත 4.1.3 ප්‍රස්ථාර සටහනෙහි දැක්වේ.




දෙපාර්තමේන්තුව තුල වාහන අලුතින් ලියාපදිංචි කිරීමේ දී අංශ තුනක් (04) යටතේ එම වාහන වර්ග කර ලියාපදිංචිය සිදු කරනු ලබයි. එනම්,

1. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව
2. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
3. වෙලඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I
   (කාර්,බස්, ලොරි, ද්විත්ව කාර්යය වාහන, සින්ගල් කැබ්, ප්‍රයිම්මුවර්, ට්‍රැක්ටර්, අවමංගල්‍ය රථ, ගිලන් රථ)
4. වෙලඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II

### 4.1.1 වෙලඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I

| | |
|---|---|
| සහකාර කොමසාරිස් | : එන්.ආර්. කැකුලන්දල මහතා |
| අධීක්ෂණ නිලධාරී | : එන්.ප්‍රේමසිරි මහතා |
| කාර්ය මණ්ඩලය | : 36 |

<u>අංශයේ දැක්ම</u>

"වෙලඳ වාහන නව ලියාපදිංචි කිරීම තුළින් මෝටර් වාහන නියාමනයෙන් ඉහල මහජන ප්‍රසාදය"

<u>අංශයේ කාර්යභාරය</u>

වාහන ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළින් සඵලදායි හා කාර්යක්ෂම සේවයක් ලබා දෙමින් විශේෂ කාර්යය වාහන, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, මෝටර් කාර් හා ත්‍රිවිධ හමුදා මඟින් මිලදී ගන්නා , රාජසන්තක කර වෙන්දේසි කරන ලද වාහන ලියාපදිංචි කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.ඊට අමතරව අංක 18,19,300,301,302 දරණ ලියාපදිංචි අංක සහිත වාහන සහ ත්‍රිවිධ හමුදා වෙන්දේසි වලින් ලබා ගන්නා වාහන සඳහා ගාස්තු අයකර ඉංග්‍රීසි EA අක්ෂර ලබා දීම, අර්ධ සුඛෝපභෝගී, ද්විත්ව කාර්යය සුඛෝපභෝගී වාහන බදු අය කර සඳහා ලියාපදිංචි කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති අනුව වාහන සඳහා ඉදිරි අංක වෙන් කිරීම හා ඒ සඳහා ගාස්තු අයකිරීම සිදුකරනු ලබයි.

වසර 2012දී මෙම අංශය මඟින් මෝටර් වාහන 106,196ක් ලියාපදිංචි කටයුතු සිදුකර ඇත. වසර 2011 දී එම ප්‍රමාණය 114,905ක් වී ඇති අතර එම වසරට සාපේක්ෂව 2012 වසරේ දී ලියාපදිංචි වු නව වෙළඳ වාහන සංඛ්‍යාව 3.57%කින් වර්ධනය අඩු වී ඇත.

### 4.1.2 වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II

| | |
|---|---|
| සහකාර කොමසාරිස් | : මධුක බණ්ඩාර මහතා |
| අධීක්ෂණ නිලධාරී | : එල්.ජී.එස් මංගලිකා මිය |
| කාර්ය මණ්ඩලය | : 13 |

<u>අංශයේ කාර්යභාරය</u>

ට්‍රැක්ටර් හා බස් රථ යන වෙළඳ වාහන ප්‍රථම වරට ලියා පදිංචි කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

### 4.1.3 ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව

| | |
|---|---|
| කොමසාරිස් | : කේ.එච්.ජේ. ලංකාදරී සේනාරත්න මිය |
| අධීක්ෂණ නිලධාරී | : එච්. විමලරත්න මහතා |
| කාර්ය මණ්ඩලය | : 11 |

**අංශයේ දැක්ම**

*"ත්‍රී රෝද රථ නව ලියා පදිංචි කිරීම තුළින් මානව හිතවාදී නීති ගරුක සමාජයක්"*

**අංශයේ කාර්යභාරය**

මෙතෙක් ලියාපදිංචි නොවූ ත්‍රිරෝද රථ පලමු වරට ලියාපදිංචි කිරීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව තානාපති කාර්යාල හා රාජ්‍ය නොවන සංවිධානයන් හි වාහන පැවරීම ලියාපදිංචිය, එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම සහ එම වාහන රටින් බැහැර ගෙන යාමට අදාල කාර්යන් ඉටුකරනු ලැබේ.


**4.1.3** වගුව **:-** ත්‍රිරෝද රථ නව ලියාපදිංචියේ ප්‍රවණතාවය

| වර්ෂය | නව ලියාපදිංචි වූ ත්‍රිරෝද රථ |
|---|---|
| 2006 | 64,466 |
| 2007 | 43,068 |
| 2008 | 44,804 |
| 2009 | 37,364 |
| 2010 | 85,648 |
| 2011 | 138,426 |
| 2012 | 98,815 |

මූලාශ්‍රය **:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු

ත්‍රිරෝද රථ නව ලියාපදිංචිය සලකා බැලීමේ දී 2011 දී ඉහල ලියාපදිංචියක් පෙන්නුම් කලද ඊට පෙර වසර වලදී මෙන්ම වසර 2012 දී 98,815 ලෙස ලියා පදිංචියේ ප්‍රවණතාව පහළ අගයක් ගෙන ඇත.එම පහළ යාමේ ප්‍රතිශතාත්මක අගය -28.61% ක් වේ.පහත 4.1.4 ප්‍රස්ථාර සටහන තුළින් එය මැනවින් විද්‍යාමාන වේ.

**4.1.4** රූප සටහන




මූලාශ්‍රය **:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 4.1.4 යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව

කොමසාරිස් : යූ.කේ. බණ්ඩාර මහතා

අධීක්ෂණ නිලධාරී : එස්.පී. රූපානන්ද මහතා

කාර්ය මණ්ඩලය : 30

<u>**අංශයේ දැක්ම**</u>

*"මහජනතාව වෙත කාල පමාවකින් තොරව විශිෂ්ට සේවාවක් සැපයීම."*

<u>**අංශයේ කාර්යභාරය**</u>


ශ්‍රී ලංකාව තුල මෙතෙක් ලියාපදිංචි නොකල නව යතුරුපැදි ලියාපදිංචි කිරීම හා ඊට අදාල සියළු කාර්යයන් ඉටු කිරීම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර ඊට අමතරව උතුරු නැගෙනහිර පළාත් දිස්ත්‍රික් කාර්යාල වල ලියාපදිංචි කර ප්‍රධාන කාර්යාල වෙත එවනු ලබන MTA 02 ආකෘතිපත් වලට අදාල ලියාපදිංචි සහතිකපත් නිකුත් කිරීම යනාදිය අංශයේ ප්‍රධාන කාර්යයට අමතරව ක්‍රියාත්මක වේ.

**4.1.4** වගුව **:-**වසර **2005** සිට ලියාපදිංචි වූ නව යතුරුපැදි සංඛ්‍යාවේ වර්ධනය

| *වර්ෂය* | *ලියාපදිංචි වූ නව යතුරුපැදි සංඛ්‍යාව* | *මුළු වාහන ගහනයට දැක්වූ දායකත්වය* |
|---|---|---|
| *2006* | *156,626* | *1,422,140* |
| *2007* | *182,508* | *1,604,648* |
| *2008* | *155,952* | *1,760,600* |
| *2009* | *135,421* | *1,896,021* |
| *2010* | *204,811* | *2,100,832* |
| *2011* | *253,331* | *2,354,163* |
| *2012* | *192,284* | *2,546,447* |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**4.1.5 රූප සටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2012 වසර තුල අලුතින් ලියාපදිංචි කරන ලද යතුරුපැදි සංඛ්‍යාව 192,284 ක් වේ.මෙම යතුරුපැදි නව ලියාපදිංචිය වසර 2011ට සාපේක්ෂව වර්ධනය -24.1% කින් පහල ගොස් ඇත.අනෙකුත් සෑම වර්ෂයකම මෙන්ම මෝටර් වාහන ගහනය සඳහා ඉහල දායකත්වයක් ලබා දෙමින් 2012 වසර තුල ද සමස්ථ මෝටර් වාහන ගහනය සඳහා යතුරුපැදි තුළින් ලබා දී ඇති දායකත්වය 2,546,447ක් වැනි ඉහල ප්‍රමාණයකි.

## 4.2 වාහන හිමිකම් මාරු කිරීම (පැවරීම)

වාහන පැවරීම යන්නෙහි ප්‍රධාන අදහස වන්නේ මෝටර් රථ දෙපාර්තමේන්තුව තුල මූලික ලියාපදිංචිය සිදුකර ඇති සියළුම වාහන වල අයිතිය නැවත පැවරීම ලියාපදිංචි කිරීමයි. මෙම වාහන පැවරීමේ කාර්යය සඳහා ඒ ඒ වාහන වර්ගය අනුව පැවරුම් අංශ හයක් යටතේ ස්ථාපිත කර ඇත. එනම්,

- ලොරි පැවරුම් අංශය
- කාර් පැවරුම් අංශය
- වෙළෙඳ වාහන අංශය
- ත්‍රිරෝද රථ පැවරුම් අංශය
- යතුරුපැදි පැවරුම් අංශය
- බස් හා ඉඩම් වාහන පැවරුම් අංශය

### 4.2.1 පැවරුම් අංශවල කාර්යභාරය

මෙම සෑම අංශයක්ම තුලම ඒ ඒ අංශයන්ට අදාල කටයුතු කාර්යක්ෂමව හා අනලස්ව ඉටු කිරිමට සාමාන්‍ය සේවා හා එක්දින සේවා පහසුකම් සපයා දි ඇති අතර මෙම සියළුම අංශයන්ගේ කාර්යභාරය පොදුවේ පහත පරිදි දැක්විය හැක.

- ❖ පැවරීම ලියාපදිංචි කිරිම.
- ❖ පරම අයිතිය හෝ උකසක් සහිතව පැවරීම ලියාපදිංචි කිරීම.
- ❖ පරම අයිතිය හෝ උකසක් අවලංගු කර පැවරීම ලියාපදිංචි කිරීම.
- ❖ ලියාපදිංචි සහතිකය සහ වාහන හැඳුනුම්පතේ අනු පිටපත් නිකුත් කිරීම.
- ❖ විධිමත් අයුරෙන් සිදු කරන භෞතික වෙනස්කම් මෙන්ම ලේඛනමය වෙනස්කම් ද ලියාපදිංචි සහතිකයේ ඇතුලත් කිරිම.
  උදා :- එංජින් අංකය, වර්ණය, ලිපිනය
- ❖ නව ඉං ශ්‍රී සි අක්ෂර සහිත වාහන වල අංක තහඩු හා ස්ටිකර් වල අනු පිටපත් නිකුත් කිරීම සඳහා දත්ත පරිගණක ගත කිරීම.
- ❖ පැවරීමක් සඳහා පැවරුම් ශාඛාවට අයදුම්පත් ඉදිරිපත් කර ඇති වාහන සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය MTA-11 ලේඛන සනාථ කර නිකුත් කිරීම.
- ❖ නෛතික කටයුතු සඳහා අවශ්‍ය වන සහතික කරන ලද පරිගණක උද්‍ධෘත නිකුත් කිරීම හා ලැබෙන විරෝධතා සටහන් කර ගැනීම.

### 4.2.2 පැවරුම් අංශවල නිලධාරී සංයුතිය

ඒ ඒ අංශයන්ට අදාල ඉහත කාර්යන් ඉටු කිරීමේ දී අදාල අංශයේ කාර්ය මණ්ඩලය වගකීමෙන් එම කාර්යන් සඳහා බැඳි සිටින අතර ඒ ඒ පැවරුම් අංශවල නිලධාරී සංයුතිය පහත සඳහන් පරිදි සාරාංශ ගත කල හැක.

**4.2.1**වගුව **:- පැවරුම් අංශවල නිලධාරී සංයුතිය**


| අංශය | මාණ්ඩලික නිලධාරී | අධීක්ෂණ නිලධාරී | විමර්ශන හා සංවර්ධන සහකාර | දත්ත/ පද්ධති සටහන් ක්‍රියාකරු | රාජ්‍ය කල. සහකාර | දෙපා. ලිපිකරු | කා.කා. ස/ දෙපා. කම්කරු |
|---|---|---|---|---|---|---|---|
| යතුරුපැදි පැවරුම් | ආර්.ඒ.කේ.රේණුකා මිය (සහකාර කොමසාරිස්) | ඒ.එම්. සෝමරත්න මහතා | 06 | 02 | 06 | 06 | 04 |
| වෙලඳ වාහන පැවරුම් | කේ.එම්.එස්.සේරසිංහ මහතා (සහකාර කොමසාරිස්) | බී.ජී. සිරිපාල මහතා | 03 | - | 04 | 08 | 02 |
| ලොරි පැවරුම් | පි.පී.කේ. අබේසිරි ගුණවර්ධන මිය (අතිරේක කොමසාරිස්) | ඒ.එම්. සෝමරත්න මහතා | 04 | - | 02 | 05 | 01 |
| කාර් පැවරුම් | බි.ජ් ප්‍රේමසිංහ මහතා (සහකාර කොමසාරිස්) | ආර්.ආර්. අලහකෝන් මහතා | 07 | - | 08 | 09 | 03 |
| ත්‍රිරෝද රථ පැවරුම් | කේ.එස්.විජයකීර්ති මහතා (සහකාර කොමසාරිස්) | කේ.පී.පී. බණ්ඩාර මහතා | 02 | - | 06 | 06 | 03 |
| බස් හා ඉඩම් වාහන පැවරුම් | නිරෝෂනී ද සිල්වා මිය. (සහකාර කොමසාරිස්) | ඩබ්.කේ. කුමාරදාස මහතා | 01 | - | 02 | 03 | 01 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

## 4.2.3 පැවරුම් අංශවල කාර්යන්ගේ ප්‍රගතිය

ලියාපදිංචි කල වාහන නැවත පැවරීම ලියාපදි කිරීම සලකා බැලීමේ දී වසර 2012 දී සමස්ථ පැවරුම් සංඛ්‍යාව 274,800ක් වී ඇත.වාහන පැවරුම්වල සිදු වු වර්ධනයේ ප්‍රවනතාවය වසර පහත 4.2.1 ප්‍රස්ථාරය තුළින් දැක්විය හැක.

**4.2.1 රූප සටහන :- වාහන පැවරුම්වල ප්‍රවනතාව**




සංඛ්‍යා සටහනට අනුව වසර 2011 දී සිදුකරන ලද 288,784 පැවරුම් සංඛ්‍යාවට සාපේක්ෂව - 4.84%ක මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරමින් සමස්ථ පැවරුම් සංඛ්‍යාව 2012 දී 274,800 මට්ටමට ළගා වී ඇත.එම වර්ධනය 2011 දී සිදු වූ 17.50%ක වර්ධනයට සාපේක්ෂව

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**


සලකා බැලීමේ දී මන්දගාමී වර්ධනයකි. එම පැවරුම් ප්‍රමාණය ඒ ඒ වාහන කාණ්ඩ අනුව පහත පරිදි වෙන් කර දැක්විය හැක.

**4.2.2 වගුව :- වාහන පැවරුම් සංයුතිය**

| *වාහන වර්ගය* | ***2011*** | ***2012*** |
|---|---|---|
| *ලොරි පැවරුම්* | *44,936* | *37,328* |
| *කාර් පැවරුම්* | *66,297* | *62,787* |
| *වෙලඳ වාහන පැවරුම්* | *47,793* | *37,126* |
| *ත්‍රිරෝද රථ පැවරුම්* | *63,194* | *74,504* |
| *යතුරුපැදි පැවරුම්* | *39,401* | *41,094* |
| *බස් පැවරුම්* | *17,720* | *13,765* |
| *ඉඩම් වාහන පැවරුම්* | *9,443* | *8,196* |
| ***එකතුව*** | ***288,784*** | ***274,800*** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**4.2.2 රූප සටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

වසර 2012 දී ඉහල පැවරුම් සංඛ්‍යාවක් සිදු වී ඇත්තේ ත්‍රිරෝද රථ පැවරුම් තුළින්ය. එහි ප්‍රතිඵලයක් ලෙස දෙවන ස්ථානයට මෝටර් කාර් පත්වී ඇති අතර සමස්ථ වාහන පැවරුම් ගහනයේ අඩුම වැදගත්කම හිමිකරගෙන ඇත්තේ ඉඩම් වාහනවේ.

**4.3 වේරහැර උපකාර්යාලය.**

වේරහැර උප කාර්යාලයේ කටයුතු පහත සඳහන් අංශ ඔස්සේ සිදුකරනු ලබයි.

1. ආයතන ශාඛාව
2. නව රියදුරු බලපත්‍ර ශාඛාව
3. රියදුරු බලපත්‍ර බලාත්මක කිරීමේ ශාඛාව
4. රියදුරු බලපත්‍ර අනුපිටපත් ශාඛාව
5. කාර්මික ශාඛාව
6. වාහන පරීක්ෂා කිරීමේ ශාඛාව
7. සරප් ශාඛාව
8. තැපැල් ශාඛාව
9. ලේඛණාගාර I/ II
10. විභාග ශාලාව

**4.3.1 කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| සහකාර කොමසාරිස් | : ජී.එච්.ආර්. ගුණවර්ධන මහතා |
| | : එන්.පී. අමරතුංග මහතා |
| | :කේ.ඩී.සී.එස් කුමාරතුංග මහතා |
| කාර්ය මණ්ඩලය | : 119 |

**4.3.2 රියදුරු බලපත්‍ර නිකුත් කිරීම.**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ උපකාර්යාලය ලෙස වේරහැර කාර්යාලය දැක්විය හැකි අතර රියදුරු බලපත්‍ර නිකුත් කිරීම හා ඒ හා සම්බන්ධ සියළු කාර්යන් ප්‍රධාන වශයෙන් මේ මගින් සිදු වුවත් එම කටයුතු හම්බන්තොට, අනුරාධපුරය, කුරුණෑගල, ගම්පහයන දිස්ත්‍රික් කාර්යාල වලට ද ව්‍යාප්ත කර ඇත. මෙම රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පිළිවෙල හා එහි ස්වභාවය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අවස්ථා ගණනක දී කාලෝචිතව විකාශනය වෙමින් වර්තමානයේ නිකුත් කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය දක්වා විකාශනය වී ඇත.මෙම ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා උසස් තත්වයේ ආරක්ෂණ උපක්‍රම භාවිතා කර ඇති අතර මෙහි බලපත්‍ර දරන්නාගේ රුධිර ගණය ද ඇතුලත් කර ඇත. මෙම රියදුරු බලපත්‍රය නිකුත් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකක් භාවිතා කරයි. එනම්,

1. On Line (වේරහැර කාර්යාලය මඟින් අනුගමනය කරයි)
2. Off Line (දිස්ත්‍රික් කාර්යාල මඟින් අනුගමනය කරයි)

2012 වසර තුල නිකුත් කරන ලද රියදුරු බලපත්‍ර වල කාර්තුමය තොරතුරු පහත වගුව තුළින් නිරූපනය වේ.


**4.3.1 වගුව**

| වර්ගය | පලමු කාර්තුව | දෙවන කාර්තුව | තුන්වන කාර්තුව | හතරවන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| පරිවර්තන | 89,441 | 54,511 | 46,947 | 40,566 | 231,465 |
| සංශෝධන | 532 | 475 | 526 | 587 | 2,120 |
| අනු පිටපත් | 2,752 | 3,201 | 3,926 | 3,812 | 13,691 |
| වාහන පංති එකතු කිරීම | 3,215 | 2,693 | 1,351 | 991 | 8,250 |
| විදේශ රියදුරු බලපත්‍ර පරිවර්තන | 946 | 2,059 | 5,324 | 6,165 | 14,494 |
| නව රියදුරු බලපත්‍ර | 86,116 | 74,138 | 95,032 | 92,673 | 347,959 |
| අලුත් කිරීම | 9 | 11 | 16 | 38 | 74 |
| **මුළු එකතුව** | 183,011 | 137,088 | 153,122 | 144,832 | 618,053 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

නව රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එම අගය ජනවාරි මස 34,354 ක් ද දෙසැම්බර් මස 16,400 ක් වෙමින් වර්ෂය පුරාවට නිකුත් කළ සමස්ථය 347,959 වී ඇත. වර්ෂය තුල ඔක්තොම්බර් මාසය තුල නිකුත් කළ නව රියදුරු බලපත්‍ර ප්‍රමාණය 41,656 ක් ලෙසඉහල අගයක් වාර්තා වී ඇත.මෙම සමස්ථ රියදුරු බලපත්‍ර ප්‍රමාණය ගම්පහ, හම්බන්තොට, කුරුණෑගල යන දිස්ත්‍රික් කාර්යාල නිකුත් කල රියදුරු බලපත්‍ර වල අගය ද එකතු වීමෙනි.

**4.3.1 රූප සටහන:- නිකුත් කල නව රියදුරු බලපත්‍ර ප්‍රමාණය**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**4.4 කාර්මික සේවාව.**

වාහන ලියාපදිංචි කිරීමේ දී සිදුකරනු ලබන කාර්මික සේවාවන්ට අදාල කටයුතු දෙපාර්තමේන්තුවේකාර්මික ශාඛාව මඟින් සිදුකරනු ලබන අතර එම කාර්යය ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මෝටර් රථ පරීක්ෂකවරු විසින් සිදුකරනු ලබයි. මෙම සේවාව සහකාර කොමසාරිස් (කාර්මික), ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරු 04 ක් හා මෝටර් රථ පරීක්ෂකවරු 110කින් සමන්විත වේ. කාර්මික සේවය සඳහා මෙම මෝටර් රථ පරීක්ෂකවරුන් ප්‍රධාන කාර්යාලයේ, වේරහැර උපකාර්යාලයේ හා සියලුම දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්ත කර ඇත.

කාර්මික සේවාව සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් වේරහැර උපකාර්යාලයෙන් හා සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් සිදු කරන කාර්යන් පොදුවේ පහත ලෙස දැක්විය හැක.

- මෝටර් වාහන පනත අනුව නීතිරීති රෙගුලාසි සකස් කිරීම හා සංශෝධන කටයුතු.
- රියදුරු බලපත්‍ර සම්බන්ධ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.
- වාහන පරීක්ෂා කර බර සහතික නිකුත් කිරීම, සංශෝධන සහතික, අනන්‍යතා සහතික නිකුත් කිරීම.
- රජයේ වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම.
- ටෙන්ඩර් මණ්ඩල සඳහා සහභාගී වීම, වාහන අවලංගු කිරීම, වෙන්දේසියට පෙර තක්සේරු කිරීම් සඳහා අදාල මණ්ඩල වලට සහභාගී වීම.
- කාර්මික ගරාජ ලියාපදිංචි කිරීම් සහ වාර්ෂික බලපත්‍ර අලුත් කිරීම.
- CMT වැසි අංක, ට්‍රේලර වැසි අංක නිකුත් කිරීම.
- රියදුරු උපදේශක පාඨමාලා සහ අනෙකුත් පුහුණු පාඨමාලා සකස් කර ක්‍රියාත්මක කිරීම.
- බරපතල අනතුරු සම්බන්ධ වාහන පරීක්ෂා කර, නිරීක්ෂණ අධිකරණය වෙත වාර්තා කිරීම.

ප්‍රධාන කාර්යාලය ඇතුළු අනිකුත් කාර්යාල වලින් සිදුකරනු ලබන කාර්මික සේවාවන් ප්‍රධාන කාණ්ඩ විස්සක් (20) යටතේ වර්ග කර දැක්විය හැකි අතර එම එක් එක් කාණ්ඩයන්ට අදාල සංඛ්‍යාත්මක දත්ත පහත 4.3.2 වගුව මඟින් සාරාංශ කර පහත පරිදි දැක්විය හැක

**4.4.1** වගුව

| | *කාර්යය* | *ප්‍රමාණය - 2012* |
|---|---|---|
| *01* | *රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත පරීක්‍ෂණ පැවැත්වීම* | *89,637* |
| *02* | *රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රායෝගික පරීක්‍ෂණ පැවැත්වීම* | *119,727* |
| *03* | *අංක තහඩු නිකුත් කිරීම (කොළඹ)* | *317,200* |
| *04* | *අංක තහඩු නිකුත් කිරීම (පිට පළාත්)* | *128,869* |
| *05* | *ගරාජ, නව වෙලඳ ආයතන පරීක්‍ෂා කිරීම* | *77* |
| *06* | *ගරාජ, නව වෙලඳ ආයතන ලියාපදිංචි කිරීම* | *93* |
| *07* | *ගරාජ, නව වෙලඳ ආයතන අලුත් කිරීම* | *755* |
| *08* | *රියදුරු පාසල් පරීක්‍ෂා කිරීම* | *51* |
| *09* | *මූලාකෘති නිකුත් කිරීම* | *372* |
| *10* | *C.M.T. වැසි අංක නිකුත් කිරීම* | *41* |
| *11* | *ට්‍රේලර් වැසි අංක නිකුත් කිරීම* | *3008* |
| *12* | *රේගු වෙන්දේසි වාහන සඳහා C.M.T. වැසි අංක නිකුත් කිරීම* | *96* |
| *13* | *යතුරුපැදි පරීක්‍ෂා කිරීම* | *2,074* |
| *14* | *නව යතුරුපැදි පරිගණක ගත කිරීම* | *177,732* |
| *15* | *බර සහතික නිකුත් කිරීම* | *11,579* |
| *16* | *අනන්‍යතා සහතික නිකුත් කිරීම* | *1,785* |
| *17* | *තහනම් නියෝග නිකුත් කිරීම* | *1,846* |
| *18* | *තහනම් නියෝග ඉවත් කිරීම* | *1,885* |
| *19* | *රිය අනතුරු පරීක්‍ෂා කිරීම* | *5,056* |
| *20* | *විශේෂ රාජකාරී සඳහා සහභාගී වීම* | *348* |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

### 4.5 වායු විමෝචන පරීක්‍ෂණ කාර්යයන් නියාමනය කිරීම.

වායු විමෝචන පරීක්‍ෂණ කාර්යයන් නියාමනය කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල භූමිය තුල වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙන යනු ලබයි.

| | | |
|---|---|---|
| අධ්‍යක්‍ෂ (වායු විමෝචන වැඩසටහන) | : | 01 |
| ගණකාධිකාරී (වායු විමෝචන වැඩසටහන) | : | 01 |
| කාර්ය මණ්ඩලය | : | 12 |

පරිසර දූෂණය වලක්වමින් පරිසර දූෂණයට ඉවහල් වන වාහන වලින් පිටවන දූම පාලනය කිරීමේ පරමාර්ථයෙන් 2008 ජනවාරි මස 25වන දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අතිවිශේෂ ගැසට් නියෝගය සහ 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත අනුව 2008 නොවැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි.

වායු විමෝචන පරීක්ෂණ සහතික නිකුත් කිරීම සඳහා පුද්ගලික සමාගම් දෙකක් (02) පත්කර ඇති අතර එම සමාගම් විසින් නිකුත් කරනු ලබන සහතිකය වසරක් සඳහා වලංගු වේ. වායු විමෝචන පරීක්ෂණ සහතිකය හෙවත් දූම් සහතිකය වාහනයේ වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කල යුතු වේ.

වායු විමෝචන පරීක්ෂණ කාර්යය ආරම්භයේ දී වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා මුල් ලියාපදිංචියේ සිට වසර තුනක් (03) දක්වා මෙරට ලියාපදිංචි කරන ලද අලුත්ම වාහන (Brand New Vehicles) වායු විමෝචන පරීක්ෂණ කාර්යයට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවීය. මෙය 2011.02.01 දින සිට පලමු වසර දක්වා සීමාවිය. 1975 දෙසැම්බර් මස 31 දිනට පෙර මෙරට ලියාපදිංචි කරන ලද වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ දී වායු විමෝචන පරීක්ෂණ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඊට අමතරව සියළුම කෘෂිකාර්මික වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ දී ද වායු විමෝචන පරීක්ෂණ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

<u>අංශයේ කාර්යභාරය</u>

මෙම අංශය තුළින් සිදු කරනු ලබන කාර්යයන් ලෙස වායු විමෝචන වැඩසටහන පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම, අදාල චක්‍රලේඛ නිකුත් කිරීම හා ඊට අදාල කටයුතු සිදු කිරීම, රථ වාහන කලමනාකරණය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සිදු කිරීම, මෙම වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය මගින් සිදු කරනු ලබයි.

වායු විමෝචන කටයුතුවල දැනට ඇති ගැටළුව වන්නේ අදාල සමාගම්වල ඇතැම් මධ්‍යස්ථාන මඟින් වංචනික ලෙස දූම් පිට කරන වාහන සඳහා බලපත්‍ර ලබා දෙන බවයි.වායු විමෝචන කටයුතු වඩා හොඳින් අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් මාර්ගස්ථ පරීක්ෂා කිරීම් පුළුල් කිරීම ආරම්භ කර තිබේ.මේ යටතේ මහා මාර්ගයේදී දූම් පරීක්ෂාව සිදු කල හැකි යන්ත්‍ර ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු යොදා ඇති අතර, මහජනතාවගෙන් ලැබෙන තොරතුරු මත පදනම්ව සිදුකරනු ලබන පරීක්ෂාවන් පුළුල් කර ඇත.මෙහිදී දූම් සහතිකය සහිත, වාහනයක් වුවත් මහාමාර්ග වලදී දූම් පිට කරමින් ධාවනය වන අවස්ථා වලදී ඒවා නවතා

පරීක්‍ෂා කිරීමටත්, එවැනි වාහන සම්බන්ධව දුරකථන පණිවුඩ ලැබුනු විටදී ඒවා ගෙන්වා පරීක්‍ෂා කිරීමටත්, විධිවිධාන සලසා ඇත. මේ තුළින් දූෂිත වාතයෙන් තොර පවිත්‍ර පරිසරයක් ඇති කිරීමට අපේක්‍ෂා කරයි.

ඉහළ යන වාහන ප්‍රමාණය හේතුවෙන් නාගරික හා අර්ධ නාගරික ප්‍රෙද්ශ වල ඇති වන වායු දූෂණය අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වායු විමෝචන නියාමන වැඩසටහන් තව දුරටත් සවි බල ගත් වන ලදී. ඒ යටතේ ජංගම වායු විමෝචන පරික්ෂණ ඒකකයක් ඇති කරන ලද අතර දිස්ත්‍රික් මට්ටමේදී අදාල පරික්ෂණ ඒකකයක් ඇති කරන ලදී.

## 5. 2011 දී ආදායම් හා වියදම්

### 5.1 ගිණුම් ශාඛාව

| | |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී | : ඩී.එස්.ආර්.කේ.ගුණතිලක මහත්මිය |
| ගණකාධිකාරී | : ඩී.කේ.එම්.ආර්. කුමාරසිරි මහතා |
| අධීක්‍ෂණ නිලධාරී | : ආර්.එම්.ජී යශෝමැණිකේ මිය. |
| කාර්ය මණ්ඩලය | : 25 |

<u>අංශයේ දැක්ම</u>

“නිවරුදි වුත් විනිවිද වුත් ඵලදායි මුල්‍ය කළමනාකරණයෙන් ආයතනික අභිවෘද්ධිය”

<u>අංශයේ කාර්යභාරය</u>

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සඳහා වැටුප් ගෙවීම, අතිකාල ගමන් වියදම් හා ණය අත්තිකාරම් ගෙවීම් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම, සියළුම උපකරණ හා ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු, ආදායම් වියදම් පිළිබඳ සියළු ගිණුම් කටයුතු, විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවට අදාල කටයුතු සඳහා වාර්තා සැපයීම, ආදායම් රැස්කර ගිණුම් ගත කිරීම හා මහභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම, මුදල් රෙගුලාසි 135 යටතේ බල තල පැවරීමට අදාල කටයුතු ආදිය ගිණුම් ශාඛාවේ කාර්යභාරය වේ.

## 5.2 සුඛෝපභෝගී බදු ශාඛාව

ගණකාධිකාරී : අයි.ජී.එස්.එස්. සිරිමාන්න මිය

අධීක්ෂණ නිලධාරී : බී.ජී.ඒ.ඩී. පෝල් මහතා

කාර්ය මණ්ඩලය : 12

<u>**අංශයේ දැක්ම**</u>

"විධිමත් බදු කරණය තුළින් ජාතික සංවර්ධනයට උර දීම."

<u>**අංශයේ කාර්යභාරය**</u>

1995 අංක 16 දරණ මුදල් පනත හා සංශෝධිත පනත් යටතේ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛොපභෝගී ද්විත්ව කාර්යය බදු අයකිරීම සිදුකරන රක්‍ෂණ ආයතන කලමනාකරණය කිරීම හා මඟ පෙන්වීම, බදු ගෙවීම පිළිබඳ වාහන හිමියන් දැනුවත් කිරීම සහ හිග බදු අයකිරීම, බදු ගෙවීම සම්බන්ධව ඒ ඒ වාහන වෙනුවෙන් පරිගණක පද්ධතිය පවත්වාගෙන යාම, බදු ආදායම් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා ආදායම් වාර්තා සකස් කිරීම.

## 5.3 අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව

ප්‍රධාන අභ්‍යන්තර විගණක : ආර්. කහදූවආරච්චි මහතා

කාර්ය මණ්ඩලය : 08

<u>අංශයේ දැක්ම</u>

*"විගණන හා විමර්ශණ කටයුතු තුළින් ඉහල ඵලදායිතාව"*

<u>**අංශයේ කාර්යභාරය**</u>

දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යාලය, උප කාර්යාලය ඇතුළු සියළුම ශාඛා කාර්යාල වල අභ්‍යන්තර විගණන කටයුතු හා විමර්ෂණ කටයුතු සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පවරන ලද රාජකාරී කටයුතු ඉටු කිරීම අංශයේ කාර්යභාරය වේ.

## 5.4 ආදායම් ගිණුම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන සියළුම ආදායම් කාණ්ඩ තුනක් යටත් දැක්විය හැක. එනම්,

- ✓ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද
- ✓ මෝටර් වාහන විකිණීම මත බදු
- ✓ මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු

**2012 වසර සඳහා ඇස්තමේන්තු කල ආදායම හා තත්‍ය ආදායම.**

**5.4.1 වගුව**

| *ආදායම් විස්තරය/ ආදායම් ශීර්ෂය* | *2012 ඇස්තමේන්තුගත ආදායම* | *2012 තත්‍ය ආදායම* |
|---|---|---|
| *සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද* | *1,150,000,000.00* | *1,253,220,848.00* |
| *මෝටර් වාහන විකිණීම මත බදු* | *34,000,000.00* | *39,382,100.00* |
| *මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ බදු අයකරනු ලබන ගාස්තු* | *6,518,400,000.00* | *6,577,711,148.00* |
| ***මුළු ආදායම*** | ***7,702,400,000.00*** | ***7,870,314,096.00*** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2012 වසරේ දීඇස්තමේන්තුගත සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද තත්‍ය ආදායම හා සැසදීමේ දී 108.9% කින් ඉහල ගොස් ඇති අතර මෝටර් වාහන විකිණීම මත බදු 115.8% කින් ඉහල ගොස් ඇත. ඊට අමතරව මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු තත්‍ය ආදායමට වඩා 100.9% කින් ද ඉහල ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මුළු තත්‍ය ආදායම 2012 ඇස්තමේන්තු ගත ආදායමට වඩා 102% කින් ඉහල ගොස් ඇත. 2011 දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තත්‍ය ආදායමට සාපේක්ෂව 2012 මුළු තත්‍ය ආදායමේ වැඩිවීම 111% කි.

## 5.5 වියදම් ගිණුම

**5.5.1 වගුව**

| *වියදම්විස්තරය/වියදම් ශීර්ෂය* | *2012 ඇස්තමේන්තුගත වියදම* | *2012 තත්‍ය වියදම* |
|---|---|---|
| *පුනරාවර්ථන වියදම* | *1,217,300,000.00* | *1,528,893,206.00* |
| *ප්‍රාග්ධන වියදම* | *748,200,000.00* | *1,019,515,927.00* |
| *මුළු වියදම* | ***1,965,500,000.00*** | ***2,548,409,133.00*** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2011 වසරේ දෙපාර්තමේන්තුවේ මුළු ඇස්තමේන්තු වියදම රු. 1,217,300,000.00වන අතර වසරේ තත්‍ය වියදම රු. 2,548,409,133.00 කි. එම වියදම පුනරාවර්ථන වියදම හා ප්‍රාග්ධන වියදම ලෙස ප්‍රධාන වියදම් ශීර්ෂ දෙකක් යටතේ කාණ්ඩ ගත කල හැකි අතර වසරේ තත්‍ය පුනරාවර්ථන වියදම රු. 1,528,893,206.00ක් වන අතර තත්‍ය ප්‍රාග්ධන වියදම රු. 1,019,515,927.00කි.

## 5.5.1මූල්‍ය ප්‍රගතිය (ප්‍රාග්ධන වියදම්)

### 5.5.2 වගුව :-ප්‍රාග්ධන වියදම් වාර්තාව - 2012 (ජනවාරි - දෙසැම්බර්)

| වැය ශිර්ෂය | විස්තරය | වටිනාකම(රු.ශත) | මූල්‍ය ප්‍රගතිය% |
|---|---|---|---|
| **මුලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරිම** | | | |
| 307-02-01-2001 | ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 14,766,041.33 | 92% |
| 307-02-01-2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 3,110,662.85 | 89% |
| 307-02-01-2003 | වාහන | 190,669.52 | 10% |
| **මුලධන වත්කම් අත්පත් කරගැනිම** | | | |
| 307-02-01-2102 | ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 5,818,331.76 | 39% |
| 307-02-01-2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 14,854,444.40 | 42% |
| **හැකියා වර්ධන** | | | |
| 307-02-01-2401 | පුහුණුවීම් සහ හැකියා වර්ධනය | 848,309.60 | 50% |
| **ගොඩනැගිලි සහ ඉදිකිරිම්** | | | |
| 307-02-01-09-2104 | වේරහැර යෝජිත ගොඩනැගිල්ල අත්පත් කර ගැනිම | 0 | 0% |
| 307-02-01-10-2104 | ප්රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය කාර්යාල ඇති කිරිම | 36,050,590.93 | 68% |
| **වෙනත් මුලධන වියදම්** | | | |
| 307-02-01-01-2502 | රියදුරු බලපත්‍ර මුද්‍රණය | 934,999,067.52 | 100% |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

## 5.6 ඉදිකිරීම් සම්බන්ධ ප්‍රාග්ධන වැය ව්‍යපෘති.

- රු. මි. 18.8ක වියදමින් ප්‍රධාන කාර්යාලය ආපන ශාලාව නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

- රු.මි. 53.34 ක වියදමින් නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.

- මඩකලපුව දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල රු.මි.1.55ක වියදමින් අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇත.

- ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර රු.මි.10.90ක වියදමින් අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු නිම කිරීම.

- කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ රු:මි:7.33ක වියදමින් අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු ආරම්භ කිරීම.

- ත්‍රිරෝද රථ නව ලියාපදිංචි ශාඛාව සඳහා රු:මි:1.88ක වියදමින් නව කාර්යාල පරිශ්‍රයක් සකස් කිරීම.



*ප්‍රධාන කාර්යාලය ආපන ශාලාව නවීකරණය*

ඇමුණුම් 01

## වාහන අලුතින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2012

| වාහන පන්තිය | ලියාපදිංචි ගාස්තුව | අංක තහඩු ගාස්තු | බර සහතික ගාස්තු | තැපැල් ගාස්තු | පැවරුම් ගාස්තු | දඩ රේගුවෙන් නිදහස් කල දින සිට | |
|---|---|---|---|---|---|---|---|
| මෝටර් කාර් | CC =1600, 15,000/- CC>1600, 20,000 | 3300/- | 500/- | 50/- | 7750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 6,000/-<br>7,500/-<br>10,000/-<br>15,000/-<br>25,000/- |
| ද්විත්ව කාර්යය වාහන | 15000/- | 3300/- | 500/- | 50/- | 7750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 6,000/-<br>7,500/-<br>10,000/-<br>15,000/-<br>25,000/- |
| මෝටර් ලොරි | 3000/- | 3300/- | 500/- | 50/- | 3750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 4,000/-<br>5,000/-<br>6,800/-<br>7,800/-<br>9,800/- |
| මෝටර් බස් | 3000/- | 3300/- | | 50/- | 3750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 7,000/-<br>8,400/-<br>9,500/-<br>10,500/-<br>13,500/- |
| විශේෂ කාර්යය වාහන | 20,000/- | 3300/- | 500/- | 50/- | 2800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 3,000/-<br>5,000/-<br>7,000/-<br>9,000/-<br>10,000/- |
| ගිලන් රථ | 10,000/- | 3300/- | 500/- | 50/- | 1800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>4,000/-<br>4,500/- |
| අවමංගල රථ | 10,000/- | 3300/- | 500/- | 50/- | 1800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 6,000/-<br>7,000/-<br>8,000/-<br>9,000/-<br>10,000/- |
| ලොරි ට්‍රේලර් | 7500/- | 3300/- | 500/- | 50/- | 3100/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 5,000/-<br>6,000/-<br>7,000/-<br>8,000/-<br>9,000/- |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් වාහන/ ට්‍රැක්ටර් රෝද 4 | 7000/- | 3300/- | 500/- | 50/- | 2060/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,750/-<br>4,500/-<br>6,000/-<br>7,000/-<br>800/- |
| අත් ට්‍රැක්ටර් රෝද 4 | 1500/- | 2400/- | 500/- | 50/- | 1150/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 1,750/-<br>2,000/-<br>2,500/-<br>3,500/-<br>5,000/- |
| ට්‍රැක්ටර්ට්‍රේලර / බව්සරය | 6000/- | 3300/- | 500/- | 50/- | 2800/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>3,000/-<br>4,000/-<br>5,000/-<br>6,000/- |
| ප්‍රයිම්මුවර් | 15000/- | 3300/- | 500/- | 50/- | 3750/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 4,000/-<br>5,000/-<br>7,000/-<br>9,000/-<br>10,000/- |
| මෝටර් ට්‍රයිසිකල් | 2500/- | 2800/- | | | 1200/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,500/-<br>3,000/-<br>4,000/-<br>5,000/-<br>6,000/- |
| මෝටර් සයිකල් | 2000/- | 2400/- | | | 500/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 1,500/-<br>1,750/-<br>2,000/-<br>2,500/-<br>4,000/- |
| මෝටර් ට්‍රයිසිකල්/ වැන් | 3000/- | 2800/- | | | | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 3,000/-<br>4,000/-<br>5,000/-<br>7,000/-<br>9,000/- |
| විකල්ප ඉන්ධන මෝටර් වාහන | 1500/- | | | 50/- | 1,540/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>3,500/-<br>4,000/- |
| විදුලිබලයෙන් ධාවනය වන වාහන | 1500/- | | | 50/- | 1,540/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>3,500/-<br>4,000/- |
| ආබාධිතයන් ගේ වාහන | 1000/- | | | 50/- | 1,150/- | දින 30ට වැඩි අවු:1ට අඩු<br>අවු:1ට වැඩි අවු:2ට අඩු<br>අවුරුදු 2-3 අතර<br>අවුරුදු 3-5 අතර<br>අවුරුදු 5 ඉකුත් වූ විට | 2,000/-<br>2,500/-<br>3,000/-<br>4,000/-<br>5,000/- |

ඇමුණුම් 02

## වාහන පැවරීමේ ගාස්තු - 2012(එක්දින සේවා)

(රුපියල්)

| වාහන පන්තිය | පැවරීමේගාස්තුව | පරම අයිතිය | | | උගසක් | | සංශෝධන ගාස්තු |
|---|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කිරීම | දීර්ඝ කිරීම | අවලංගු කිරීම | ලියාපදිංචි කිරීම | අවලංගු කිරීම | |
| මෝටර් කාර් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ද්විත්ව කාර්යය වාහන | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික) | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ඉඩම් වාහන (ට්‍රැක්ටර් රෝද | 2060/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| අත් ට්‍රැක්ටර්ට | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් සයිකල් | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ට්‍රයිසිකල් | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ට්‍රයිසිකල්/ වෑන් | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ලොරි | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ලොරි/ පෝක් ලිෆ්ට් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ලොරි/ ප්‍රයිම්මූවර් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් කෝච් | 3750/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ආබාධිතයන්ගේ වාහන | 1150/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| මෝටර් ගිලන්රථ | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| අවමංගල රථ | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ලොරි ට්‍රේලර් | 3100/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| ට්‍රැක්ටර් ට්‍රේලර්/ බව්සර් | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| විකල්ප ඉන්ධන මෝටර් වාහන | 1540/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| විදුලිබලයෙන් ධාවනය වන | 1540/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |
| විශේෂ කාර්යය වාහන | 1800/- | 2750/- | 2500/- | 1000/- | 400/- | 500/- | 250/- |

මූලාශ්‍ර - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

* **ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු සඳහා රු. 50ක් අයකරනු ලැබේ.**

ඇමුණුම 03

# වාහන පැවරීමේ ගාස්තු - 2012 (සාමාන්‍ය සේවා)

**(රුපියල්)**

| වාහන පන්තිය | පැවරීමේගාස්තුව | පරම අයිතිය | | | උගසක් | | සංශෝධන ගාස්තු |
|---|---|---|---|---|---|---|---|
| | | ලියාපදිංචි කිරීම | දීර්ඝ කිරීම | අවලංගු කිරීම | ලියාපදිංචි කිරීම | අවලංගු කිරීම | |
| මෝටර් කාර් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ද්විත්ව කාර්යය වාහන | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික) | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ඉඩම් වාහන (කෘෂිකාර්මික | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ඉඩම් වාහන (ට්‍රැක්ටර් රෝද | 1200/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| අත් ට්‍රැක්ටර් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් සයිකල් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ට්‍රයිසිකල් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ට්‍රයිසිකල්/ වෑන් | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ලොරි | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ලොරි/ ෆෝක් ලිෆ්ට් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ලොරි/ ප්‍රයිම්මුවර් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් කෝච් | 2500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ආබාධිතයන්ගේ වාහන | 500/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| මෝටර් ගිලන්රථ | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| අවමංගල රථ | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ලොරි ට්‍රේලර් | 2000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| ට්‍රැක්ටර් ට්‍රේලර්/ බව්සර් | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| විකල්ප ඉන්ධන මෝටර් වාහන | 800/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| විදුලිබලයෙන් ධාවනය වන | 800/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |
| විශේෂ කාර්යය වාහන | 1000/- | 1250/- | 500/- | 500/- | 200/- | 300/- | 100/- |

මූලාශ්‍ර - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

* **ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු සඳහා රු. 50ක් අයකරනු ලැබේ.**

ඇමුණුම 04

## නව රියදුරු බලපත්‍රයට අදාල අධිභාරයන්

**(2012 )**

(රුපියල්)

| සේවාව | අයභාරය (රුපියල්) | |
|---|---|---|
| | සාමාන්‍ය සේවා | එක්දින සේවා |
| 1. නව රියදුරු බලපත්‍ර | | |
| එක් වාහන පන්තියක් සඳහා | 1700.00 | |
| වාහන පන්ති දෙකක් සඳහා | 2000.00 | |
| වාහන පන්ති තුනක් සඳහා | 2250.00 | |

| | | |
|---|---|---|
| 2. අලුත් කිරීම හෝ වලංගු කාලය දීර්ඝ කිරීම | | |
| නියමිත දිනට | 1700.00 | 2200.00 |

| | | |
|---|---|---|
| 3. රියදුරු බලපත්‍රයේ අනු පිටපතක් නිකුත් කිරීම | 1700.00 | 2200.00 |

| | | |
|---|---|---|
| 4. රියදුරු බලපත්‍රයේ තොරතුරු සංශෝධනය | 2000.00 | 2500.00 |

| | | |
|---|---|---|
| 5. රියදුරු බලපත්‍රය පරිවර්තනය | | |
| වර්තමාන රියදුරු බලපත්‍රය නව බලපත්‍රය බවට | 1700.00 | 2200.00 |
| විදේශ රියදුරු බලපත්‍රය නව රියදුරු බලපත්‍රය, | | |
| -ලාංකික පුරවැසියන් සඳහා | 2000.00 | 2500.00 |
| -විදේශීය පුරවැසියන් සඳහා පමණි | 10000.00 | 10500.00 |

| | | |
|---|---|---|
| 6. විදේශීය පුරවැසියන් සඳහා නව රියදුරු බලපත්‍රය | 15000.00 | |

| | | |
|---|---|---|
| 7. රියදුරු බලපත්‍ර උධෘතයක් | 500.00 | |

| | | |
|---|---|---|
| 8. විදේශීය පුරවැසියන් සඳහා රිය පැදවීමේ අවසරපත (එක් මාසයකට) | 1000.00 | |

| | | |
|---|---|---|
| 9. අන්තර් ජාතික නව රියදුරු බලපත්‍රය | 2000.00 | 2500.00 |

| | | |
|---|---|---|
| 10. ලිඛිත ලරීක්ෂණය නැවත අයදුම් කිරීම | 250.00 | |

| | | |
|---|---|---|
| 11. ප්‍රායෝගික පරීක්ෂණය නැවත අයදුම් කිරීම | 500.00 | |